රනිල් වික්‍රමසිංහ සහ එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය සම්බන්ධයෙන් පුවත් වාර්තාවන් මාධ්‍ය ඔස්සේ ඉදිරිපත් වී තිබිණි. මෙම පුවත තෝරාගත් සිංහල භාෂා පුවත්පත් ඔස්සේ ඉදිරිපත් වී තිබූ ආකාරය අපි නිරීක්ෂණය කළෙමු.

1) දිවයින සිරස්තලය - "රනිල් එජාප නායකත්වය අත්හරී"

2) මව්බිම සිරස්තලය - "රනිල් එජාප නායක පුටුව අත්හරී"

3) දිනමිණ සිරස්තලය - "රනිල් යන බව දැනුම් දෙයි", අන්තර්ගතය - සුදුසු නව නායකත්වයක් බිහිවූ විට එජාප නායකත්වයෙන් ඉවත් වන බව රනිල් වික්‍රමසිංහ මහතා සඳහන් කළ බව පක්ෂ මහලේකම් පවසයි.

4) ලංකාදීප සිරස්තලය - "නායකයකු හදා යන්න සූදානම්", අන්තර්ගතය - එජාප නායකත්වයේ දිගටම රැඳී සිටීමට අදහසක් නැති හෙයින් නව නායකත්වය සඳහා සුදුසු නමක් යෝජනා කරන ලෙස එජාප ජ්‍යෙෂ්ඨයින්ට රනිල් වික්‍රමසිංහ මහතා දැනුම් දෙයි.

5) අරුණ සිරස්තලය - "සුදුස්සකු එනතුරු රනිල් ඉවත් නොවේ", අන්තර්ගතය - "පක්ෂයට පැහැදිලි නායකත්වයක් ලැබෙනා තුරු පක්ෂ නායකත්වයෙන් ඉවත් නොවීමට එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ තීරණය කර ඇත".

සැමවිටම නිරවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම මාධ්‍යයක ආචාර ධාර්මික වගකීමක් වේ. මන්දයත්, පාඨකයාට එම පුවත සම්බන්ධයෙන් සමබර, නිවැරදි තීරණයක් ගැනීමට අවකාශ සැලසෙන්නේ ඒ අනුව වන බැවිනි. යම් පුවතක් ඉදිරිපත් කිරීම සඳහා රාමුගත කිරීම ඔස්සේද එම පුවතේ නිරවද්‍යතාවය ගිලිහී නොයන බවට මාධ්‍ය වගබලාගත යුත්තේ ඒ හෙයිනි. ඔබේ අදහසට අනුව මේ අතරින් නිවැරදි සිරස්තලය වන්නේ කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #News #Dinamina #Divaina #Mawbima #Lankadeepa #Aruna